www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රුසියානු විප්ලවයෙන් අනූ වසරක්: 21 වැනි සියවසේ සමාජවාදය සඳහා අවස්ථාවන්

## පලමු වන කොටස

## Ninety years since the Russian Revolution: The prospects for socialism in the twenty-first century

**නික් බීම්ස් විසිනි**
**2007 නොවැම්බර් 24**

*යට දැක්වෙන්නේ නොවැම්බර් 18 දින සිඩ්නිහි ද නොවැම්බර් 20 දින පර්ත්හි ද නොවැම්බර් 21 දින මෙල්බර්න්හි ද පවත්වන ලද මැතිවරන රැස්වීම්වල දී ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා මැතිවරනයේ නිව් සවුත්වේල්ස් සෙනේට් සභා අසුනට තරග කල පක්ෂයේ අපේක්ෂකයා ද වූ නික් බීම්ස් විසින් පවත්වන ලද දේශනයක පලමු වන කොටසයි.*

වසර අනූවකට පෙර, 1917 නොවැම්බර් 7 දින (මෙය රුසියානු දින දර්ශනයට අනුව ඔක්තෝබර් 25) 20 වැනි සියවසේ ශ්‍රේෂ්ඨතම සිද්ධිය ඇති විය. රුසියානු විප්ලවය හුදෙක් ලෝකය සසල කලා පමනක් නොව ඉන් පසු කාලයේ දේශපාලනය හා ඉතිහාසය ද හැඩ ගැන්වී ය.

එහි කල් පවත්නා වැදගත් කම රඳා පවත්නේ, මානව ඉතිහාසයේ ප්‍රථම වතාවට වැඩ කරන ජනතාව දේශපාලන බලය අල්ලා ගෙන රුසියාවේ ද ජාත්‍යන්තර පරිමානව ද සමාජය යලි හැඩ ගැස්වීමේ කර්තව්‍යය සවිඥානකව ම බාරගත්තේ ය යන කාරනය මතය. මානව ශිෂ්ඨාචාරය යුග ගනනාවක් රැඳී පැවතියේ ඔවුන්ගේ ශ්‍රමය මත ය.

නොයෙකුත් ක්‍රමවලින් වසර අනූවක් ම අපි රුසියානු විප්ලවය පැනනැංගාවූ සමාජයෙන් හුදෙකලා කරනු ලැබුවෙමු. එහෙත් ප්‍රගාඪ අර්ථයකින් අප ජීවත්වන්නේ රුසියානු විප්ලවයේ අවධිය තුලයි. ගතවූ දශක නවය තුල බොහෝ දේ වෙනස් වී ඇත. මිනිසාගේ ශ්‍රමයෙහි ඵලය වන නිෂ්පාදන බලවේග, විද්‍යාව හා විද්‍යාත්මක භාවිතය දැවැන්ත පරිමානයකින් ප්‍රසාරනය වී තිබේ. එහෙත් ධනේශ්වර සමාජ සම්බන්ධතාවන් නොවෙනස්ව පවතී. නිෂ්පාදනය තවමත් කෙරීගෙන යන්නේ වෙලඳපොලේ අනට අනුව ය. එහි ගාමක බලය වන්නේ පෞද්ගලික අයිතියේ ඇති සංගතයන්ගේ ලාභය සඳහා අරගලයයි. ආර්ථික හා සමාජ ජීවිතයේ සියලු අංශයන්ගේ ගෝලීය ස්වභාවය තිබිය දී ම, ජාතික රාජ්‍ය පද්ධතියෙන් ලෝකය වෙනස් වී තිබේ. එය, ධනේශ්වර ලෝක බලවතුන් අතර සතුරුකම් හා ගැටුම්වලට තුඩු දී ඇති අතර යුද්ධයේ තර්ජනය එල්ල කරයි.

බොහෝ දේ වෙනස් වී තිබේ. එහෙත්, රුසියානු කම්කරු පන්තිය විප්ලවයේ මාවතට යොමු කල හා ඉන් පසුව ගතවූ වසරවල දැකගත හැකි වූ පරිදි මිලියන ගනන් කම්කරුවන්, තරුනයන් හා සමාජවාදයට නැඹුරු බුද්ධිමතුන් එම මාවතට ම යොමු කල සමානවූ ඓතිහාසික ගැටලු සමග මනුෂ්‍ය වර්ගයා තවමත් පොර බදමින් සිටිති.

රුසියානු විප්ලවයෙන් පසු දා පටන් ම ලෝකය පුරා පාලක පන්තීන් එය තර්ජනයක් ලෙස හඳුනාගත්හ. "බොල්ෂෙවික් ආසාදනය" ලෙස ඔවුන් හැඳින්වූ දෙය පැතිර යනු ඇතැයි ඔවුන් භීතියට පත්වූහ. ඔවුන් සියලු දෙනාම වෙනුවෙන් කථා කරමින්, "තොට්ල්ලේ දී ම බොල්ෂෙවික් ලදරුවාගේ ගෙල සිරකිරීම" වින්ස්ටන් චර්චිල් ප්‍රකාශ කලේ ඒ අනුව ය. ඊ ලඟ මාසවල දී ප්‍රථම කම්කරු රාජ්‍යය පෙරලා දැමීම සඳහා හමුදාවන් 14ක් පිටත් කර හැරීමෙන් ඔවුන් කරන්ට උත්සාහ කලේ හරියට ම එයයි.

ආරම්භයේ පටන් ම පාලක පන්තීන් හා ඔවුන්ගේ කථිකයන් රුසියානු විප්ලවයට එරෙහිව දේශපාලන හා දෘෂ්ටිමය යුද්ධයක් ගෙන ගියහ. කුමන්ත්‍රනයක් ද සතුරු කථිකාවක් ද ප්‍රචන්ඩ කැරලි ගැසීමක් ද වූ විප්ලවය දියත් කලේ ඒකාධිපති තන්ත්‍රයක් ගොඩ නැගීම සඳහා අන්තගාමී ලෙනින් විසින් ය. බොල්ෂෙවිකයන් විසින් තලා දමන විට රුසියානු ප්‍රජාතන්ත්‍රය මල් පල දැරීමට ඔන්න මෙන්න කියා තිබුනි.

1917 සිට අද දක්වා ම පාලක පන්තීන්ගේ න්‍යායවාදීන්, රුසියානු විප්ලවය වනාහී ජනතාවගේ ඓතිහාසික ක්‍රියාදාමයට ඇතුල්වීමේ ප්‍රතිඵලය හා කම්කරු පන්තියේ දැවැන්ත සමාජ බලවේගය එය ඉදිරියට තල්ලු කල ගාමකය වූයේ ය. යන සරල සථ්‍යය පිලිගැනීමට අසමත් වූ බව සනාථ වී ඇත.

1991 දී සෝවියට් සංගමය බිඳවැටීම හමුවේ මෙම දෘෂ්ටිමය ප්‍රහාරය වෙන කවරදාටකත් වඩා කර්කෂ වූයේ, ඓතිහාසික සත්‍යය පිලිබඳ සියලු උත්සුකයන් පසෙකට අතු ගා දමමිනි.

සෝවියට් සංගමය බිඳ වැටීමට හේතුව ඔවුන් ප්‍රකාශ කල පරිදි, විප්ලවය හුදෙකලා වීම, බටහිර යුරෝපයේ දියුනු ධනපති රටවලට එය පැතිරී නොයාම හා ස්ටැලින්වාදයේ රූපයෙන් නිර්මානය වූ එම හුදෙකලාවෙන් ජනිත කල භයංකර පරිහානිය සමග මොනම සම්බන්ධයක් හෝ නොවී ය. ඒ වෙනුවට, එය ඔක්තෝබර් විප්ලවයේ ම අනිවාර්ය ප්‍රතිඵලය විය. සාපරාධී ව්‍යවසායක් වූ එහි මූලාරම්භය පැවතුනේ බොල්ෂෙවික්වාදයේ ඒකාධිපති සංකල්පයන් තුල ය. සියල්ලටත් වඩා සෝවියට් සංගමයේ අවසානයෙහි අර්ථය නම් ඉතිහාසයේ ම නො වේ නම් මාක්ස්වාදයේ හා සමාජවාදයේ නිශ්චිත අවසානයයි.

එවන් නිගමනයන් පදනම් වූයේ මාක්ස්වාදය හා ලෝක සමාජවාදී විප්ලවය පිලිබඳ එහි ඉදිරි දර්ශනය සෝවියට් සංගමයේ ඉරනම හා ඉතිහාසය සමග සාවද්‍ය ලෙස අනන්‍ය කිරීම මත ය. මාක්ස්වාදී ව්‍යාපාරය රුසියානු විප්ලවය පූර්වාපේක්ෂා කල අතර එය සංවිධානය කර මෙහෙයවී ය. එහෙත් සෝවියට් සංගමය තුල පසුව ඇති වූ දේත්, මාක්ස්වාදයත් කුමන ආකාරයකින් වත් සමාන වූයේ නැත. සත්‍ය ලෙස ම සෝවියට් සංගමයේ ඓතිහාසික වර්ධනයෙහි සන්ධි ස්ථානය වූයේ ස්ටැලින්වාදය විසින් මාක්ස්වාදය මැඬ, පසුව මුලිනුපුටා දැමීම යි.

දශක හතකටත් පෙර, සෝවියට් සංගමය නමැති ඉෂ්ටවූ කාරනාව හමුවේ ධනේශ්වර ලිබරල්ලු හා විද්වත්හු වැඳවැටෙන අවස්ථාවේ මාක්ස්වාදී ව්‍යාපාරය එනම් ලියොන් ට්‍රොට්ස්කි විසින් නායකත්වය දුන් හතරවන ජාත්‍යන්තරය, කම්කරු පන්තිය විසින් ස්ටැලින්වාදී නිලධරය පෙරලා නොදැමුනහොත් සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ (සෝසසසං) විනාශයටත් ධනවාදය පුනරුත්ථාපනය කිරීමටත් එමගින් මාර්ගය පෑදෙනු ඇතැයි පැහැදිලි කලේය.

එහෙත්, මිනිසාගේ සමාජ පැවැත්මෙහි මූලික නියාමයන් උල්ලංඝනය කිරීම නිසා පරිහානිය, විප්ලවයේ ම පරවේනියක් ය යන සිය මතය කුඩු වී යනු ඇත යන හේතුව නිසා සමකාලීන දක්ෂිනාංශික ඉතිහාසඥයන් කිසිවෙකුටත් ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය පිලිබඳ බැරෑරුම් විචාරයක් කල නොහැකි විය.

ඉතිහාසඥ රිචඩ් පයිප්ස්ට අනුව, නිෂ්පාදන ක්‍රමයේ පෞද්ගලික අයිතිය අවසන් කිරීමට දැරූ උත්සාහය අසාර්ථක වීමට නියමිතව තිබිනි. අනාගතයේ දී ද එවන් සියලු උත්සාහයන් නිරර්ථක වනු ඇත. මන්ද යත් පෞද්ගලික හිමිකම "තාවකාලික සංසිද්ධියක් නොව සමාජ ජීවිතයේ නිත්‍ය අංගයක් හා එබැවින් ම විනාශ කල නොහැකි ද වන" නිසා ය. එමනිසා සමාජවාදය ගන්නේ ආඥාදායක රූපයකි. එය මනුෂ්‍ය වර්ගයාගේ අත්‍යාවශ්‍ය අංග ලක්ෂනයන් උල්ලංඝනය කිරීමේ උත්සාහයකි. එහෙයින් බල ගැන්වීමට සිදුවන්නේ ද බලය යෙදීම මගිනි. ලෙනින් මෙය දැන සිටියේ ය. 1903 බොල්ෂෙවික් පක්ෂයේ මූලාරම්භයේ දී ම ඔහු ආඥාදායක තන්ත්‍රයක් පිහිටුවීමට වෙර දැරුවේ ඒ නිසා ය.

ඉතිහාසඥ මාටින් මාලියා අවධාරනය කලේ පෞද්ගලික දේපල මැඩ පැවැත්වීම "සැබෑ ලෝකය මැඩීමට දරන උත්සාහයකි. එය දිගු කාලයේ දී අසාර්ථක විය හැකි දෙයකි."

වෙනත් වචනවලින් කිවහොත් විප්ලවය සාර්ථක විය නොහැකි ය. මන්ද යත් ධනේශ්වර නොවන සමාජයක් නිසගයෙන් ම කල නොහැකි දෙයක් වන නිසාය. සෝවියට් සංගමය බිඳ වැටීම හමුවේ ෆ්‍රැන්සිස් ෆුකුයාමා "ඉතිහාසයේ අවසානය" නිවේදනය කලේ මෙම දෘෂ්ටියේ අනිවාර්ය නිගමනය ලෙස ය. එහි අර්ථය ධනේශ්වර වෙලඳපොලත් සමඟ ම මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික පරිනාමය අවසාන වනු ඇති බවයි.

## ඓතිහාසික සංවර්ධනයේ නියාමයන්

"ඉතිහාසයේ අවසානය" ඇඟවුම් කරන එවන් දෘෂ්ටියක් තවත් නිගමනයකට ද ගමන් කරයි. නිෂ්පාදන ක්‍රමයේ පෞද්ගලික දේපල මානව ශිෂ්ඨාචාරයට ම ආවේනික දෙයක් නම්, මානව සමාජයේ ඓතිහාසික වර්ධනය අප පැහැදිලි කරන්නේ කෙසේ ද? දේපල වැනි යමක් නොපැවතියා වූ මානව පැවැත්මේ සහස්‍රකය සඳහා යමෙක් කරුනු දක්වන්නේ කෙසේ ද? ඉතිහාසය පුරා සිදු වූ දේපල රූපයන්ගේ පරිවර්තනය, එනම් වහල් ක්‍රමයෙන් වැඩවසම් ක්‍රමයටත්, විවිධ වර්ගවල ආසියාතික ආඥාදායකත්වයෙන් හා අවසාන වසයෙන් පසුගිය වසර 500 තුල ධනවාදයේ ම නැගීමෙන් ද සිදු වූ දේ යමෙක් පැහැදිලි කරන්නේ කෙසේ ද?

වහල් ක්‍රමය හා වැඩවසම් ක්‍රමයට අනන්‍ය වූ දේපලවලට වඩා, ධනේශ්වර දේපල රූපයන් මනුෂ්‍ය වර්ගයාගේ සාරාත්මය තුල වැඩියෙන් පැලපදියම් වී ඇත්තේ නැත. මිනිසාගේ සාරාත්මය මෙන් ම මනුෂ්‍ය ස්වභාවයට ද එරෙහි අපරාධයක් ලෙස සමාජවාදී විප්ලවය හෙලාදකින්නා වූ ප්‍රතිගාමී ඉතිහාසඥයන්, දෙවියන් වහන්සේගේ අභිමතයට අනුකූල යයි ප්‍රකාශ කරමින් වැඩවසම් සමාජයට ආශීර්වාද කල අතීත යුගයේ පූජකයන්ට සමාන නූතන යුගයේ පූජකයන් බවට පත්ව තිබේ.

එහෙත් පල්ලියේ ආශීර්වාදය තිබියදී ම ධනවාදය විසින් වැඩවසම් සමාජයත් එහි දේපල

රූපයනුත් පෙරලා දමා එයට තමන් ආදේශ වූයේ වැඩවසම් ක්‍රමය, ඊට පූර්වයෙන් වූ සමාජ රූපයන්ට ආදේශ වූ ආකාරයට ම ය.

එසේ නම් ඓතිහාසික සන්තතිය අප පැහැදිලි කරන්නේ කෙසේ ද? මෙහි දී අපට මාක්ස්ගේ ශ්‍රේෂ්ඨ සොයාගැනීම් දෙකකින් එකක් අභිමුඛ වේ. එනම් මානව ඉතිහාසය පිලිබඳ වර්ධනයේ නියාමය යි.

1859 දී එනම් ඩාර්වින්, "සත්ව වර්ගයාගේ මූලාරම්භයෝ" නම් සිය කෘතිය ප්‍රකාශයට පත් කරමින් මිනිසාට තමන්ගේ ම ජීව විද්‍යාත්මක ආරම්භය අධ්‍යයනයට මග හෙලිකල එම වර්ෂයේ ම මාක්ස්, මනුෂ්‍ය සමාජයේ ඓතිහාසික වර්ධනය පාලනය කරන නියාමයන් සූත්‍රගත කලේ ය. "සිය පැවැත්ම සඳහා මිනිසුන් යෙදී සිටින සමාජ නිෂ්පාදනයේ දී නිශ්චිත සම්බන්ධතාවන්ට එලඹීම නොවැලැක්විය හැකි අතර ඒවා නිෂ්පාදනයේ ඔවුන් සතු වන්නා වූ විශේෂිත නිෂ්පාදන සම්බන්ධතා ය.

"සමාජ විඥානය නිශ්චිත රූපාකාරයන්ට අනුරූප වන නීතිමය හා දේශපාලන උපරිව්‍යුහය පැන නගින්නේ මෙම නිෂ්පාදන සම්බන්ධතාවන් සමූහයට අන්තර්ගතවන සමාජයේ සැබෑ පදනම වන ආර්ථික ව්‍යුහය මතය. සංවර්ධනයේ නිශ්චිත අදියරක දී, සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදන බලවේගයන් පවත්නා නිෂ්පාදන සම්බන්ධතාවන් හෝ දේපල සම්බන්ධතාවන් සමග මෙතෙක් ඒවා ක්‍රියාත්මක වී තිබෙන රාමුව ඇතුලත, ගැටුමට එලඹෙයි. නිෂ්පාදන බලවේග වර්ධනය කරන රූපාකාරයන්ගේ සිට මෙම සම්බන්ධතාවන්, ඒවායේ විලංගු බවට පත් වෙයි. එවිට සමාජ විප්ලවයේ යුගයක් ආරම්භ වේ. ආර්ථික පදනමේ ඇතිවන වෙනස්කම් ඉක්මනින් හෝ පසුව දැවැන්ත උපරිව්‍යුහයේ සමස්තය පරිවර්තනය කිරීමට මුල පුරයි." (අ කොන්ට්‍රිබියුෂන් ටු ද ක්‍රිටික් ඔෆ් පොලිටිකල් ඉකොනොමි 1859, සංඥාපනය)

ප්‍රතිගාමීන් කියාපෑමට වෑයම් කරන පරිදි රුසියානු විප්ලවය සිදු වූයේ ඉතිහාසයේ නීතිවලට පටහැනිව නො වේ. ඒවාට අනුකූලව ය. එය මාක්ස්වාදීන් විසින් පූර්වාපේක්ෂා කර සංවිධානය කර මෙහෙයවන ලදී. ඔවුන් සිද්ධීන්ගේ වෛෂයික තර්කනය මත තෙමේ ම පදනම් වූ අතර පන්ති සම්බන්ධතාවන් පිලිබඳ විද්‍යාත්මක හා ඓතිහාසික වැටහීමක් මත පිහිටා සිටියහ.

රුසියානු විප්ලවයත් සමග මනුෂ්‍ය වර්ගයා සිය ඓතිහාසික වර්ධනයේ නව අදියරකට ලඟා විය. මෙහි දී ප්‍රථම වතාවට ඉතිහාසය, එහි වර්ධනයේ නියාමයන් මත සවිඥානකව පදනම් වෙමින් ගොඩනැගීමට කෙරෙන අරගලයක් අපට දැකගන්නට ලැබේ. එහි ක්‍රියාකාරී හවුල්කරුවන්, සමාජ හා දේශපාලන ක්‍රියාවලීන් දිගහැරෙන ආකාරයට ඒ පිලිබඳ විද්‍යාත්මක විශ්ලේෂනයක් සහිතව එම විශ්ලේෂනයේ පදනම මත සිද්ධීන්ගේ ගමන් මග වෙනස් කිරීමට ප්‍රායෝගික ආරම්භකත්වයක් ගනු ලැබින.

මෙම නව අදියරට මග හෙලිකල ක්‍රියාවලීන් අපි විභාග කර බලමු.

මාක්ස් ශ්‍රේෂ්ඨ සොයාගැනීම් දෙකක් කල බව මම මීට පෙර සඳහන් කලෙමි. ඔහු ඓතිහාසික වර්ධනයේ පොදු නියාමයන් හෙලිදරව් කලා පමනක් නො වේ, ඔහු ධනේශ්වර සමාජයේ චලනය පිලිබඳ නියාමය ද හෙලිදරව් කලේ ය. මානව ඉතිහාසය අත් දුටු නිෂ්පාදන බලවේගයන්ගේ දැවැන්ත ම වර්ධනයට නිදහස් වැටුප් ශ්‍රමය හා නිෂ්පාදන ක්‍රමයේ පෞද්ගලික අයිතිය පිලිබඳ පද්ධතිය තුඩු දුන්නේ කෙසේ ද යන්න හා ඒ සමග ම මෙම නිෂ්පාදන ක්‍රමය බිඳදැමීමේ මාර්ගය සූදානම් කර සමාජවාදය මගින් එය ඌන පූරනය කරන්නේ කෙසේ ද යන්න ද ඔහු හෙලිදරව් කලේ ය.

නිෂ්පාදනය පිලිබඳ සියලු පූර්ව කාර්මික ක්‍රමයන් සංස්ථිතිකවාදය මගින් අංගලක්ෂනය කර තිබේ. ධනේශ්වර සමාජය සම්බන්ධයෙන් එය එහි ප්‍රතිවිරෝධය වන්නේ ය.

"නිෂ්පාදනයෙහි නිරන්තරව ඇතිවන විප්ලවීය වෙනස්වීම්, සියලු සමාජීය සබඳතාවන්හි ඇති වන නිර්බාධිත කැලඹීම් සදාකාලික අවිනිශ්චිතභාවය හා කැලඹීම් මගින් ධනවාදී යුගය අන් සියලු යුගවලට වඩා වෙනස් වෙයි" 1948 දී මාක්ස් කොමියුනිස්ට් ප්‍රකාශනය තුල ලිවී ය.

එහෙත් ධනවාදය ම පෙරලා දැමීම සඳහා පදනම සපයා ඇත්තේ ද සංවර්ධනයේ එම ගාමකය විසින් ම ය. එමගින් ධනේශ්වර පන්තිය ලෝකය පුරා දුවවනු ලබයි. ලාභ පද්ධතියේ නිර්දය තර්කනය මගින් තල්ලුව සපයන නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය, නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය මත පදනම් වූ සමාජ සම්බන්ධතා සමග ගැටුමට එලඹෙයි. ශ්‍රම ඵලදායිතාවේ වැඩීම ම ද ධනේශ්වර සමාජයේ බිඳවැටීමට ද තුඩු දෙමින් විප්ලවකාරී අර්බුදයක් ජනනය කරයි.

1873 මූල්‍ය අර්බුදයෙන් පසුව එලඹි දශක දෙක තුල ධනවාදය අංගලක්ෂිත වූ මිල හා ලාභය "මහා අවපාතය"ට ඇද වැටීමෙන් 1883 මාක්ස් ගේ අභාවයෙන් පසු ආසන්න වසරවල මෙම ඉදිරි දර්ශනය සනාථනය ලබා ගත්තේ ය. කෙසේ වුව ද 1890 ගනන් මැද වන විට කැපීපෙනෙන වෙනසක් දැකිය හැකි ය. ධනේශ්වර වර්ධනයේ නව අදියරක් - (චන්ද්‍රාලෝකයේ අඩු වැඩිවීමට අනුකූලව ඇතිවන) "උදමත්" පැහැදිලිව ම ආරම්භ වී තිබුනි.

ජාත්‍යන්තර මාක්ස්වාදී ව්‍යාපාරයේ ප්‍රධාන පක්ෂය වූ ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රධාන

නායකයා වූ එඩුවාඩ් බර්න්ස්ටයින් විසින් වර්ධනය කල න්‍යායන් තුල ඉහත වර්ධනයේ ප්‍රකාශනය අත්කර ගත්තේ ය. බර්න්ස්ටයින්ට අනුව ධනවාදය තුල ම සිදුවන වර්ධනයන් මාක්ස්ගේ "බිඳවැටීමේ" න්‍යාය පිලිබඳ තීන්දුව ප්‍රකාශයට පත්කරයි.

අර්බුදයට තුඩුදෙන ආවේනික ප්‍රවනතා ඇත්තේ නැත. එබැවින් සමාජවාදය, විප්ලවකාරී ලෙස දේශපාලන බලය  අල්ලා ගැනීමෙන් ලඟාවන්නේ ද නැත. ඒ වෙනුවට එය ඇතිවන්නේ (සමාජවාදය) වෘත්තීය සමිති ව්‍යාපාරය මගින් දිනා ගන්නා සමාජ ප්‍රතිසංස්කරන හා වෙනත් ජයග්‍රහනවල අනුක්‍රමික රාශීකරනයෝ ය.

බර්න්ස්ටයින්ගේ ඉදිරි දර්ශනය, මාක්ස්වාදී ඉදිරි දර්ශනයේ පදනම්වලට හා විප්ලවවාදී පක්ෂයටමත් එල්ල කෙරෙන ප්‍රහාරයකි. ධනවාදය තුල ඊට ආවේනික බිඳ වැටීමේ ප්‍රවනතාවක් නොපවත්නේ නම් එවිට සමාජවාදය සඳහා ඓතිහාසික අවශ්‍යතාවක් ද නොපවතී. රෝසා ලක්සම්බර්ග් සඳහන් කල පරිදි එසේ නම් සමාජවාදය වනාහී යම් වර්ගයක මනෝරාජ්‍යයක්, නොඑසේ නම් මනරම් සංකල්පයක් වැනි ඔබ නම් කිරීමට මනාප ඕනෑ ම දෙයක් විය හැකිය. තව දුරටත් එය ධනේශ්වර සමාජයේ ද්‍රව්‍යමය වර්ධනයේ ප්‍රතිඵලය නම් නො වේ.

කාරනය එවැන්නක් නම් සමාජවාදය සඳහා අරගලය පදනම් කල යුත්තේ කුමක් මත ද? ලක්සම්බර්ග් එය මෙසේ පැහැදිලි කලා ය. "ඓතිහාසික ගමනාගමනයේ විශ්වසනීය මාධ්‍යයන් හිඟවීම නිසා පෘතුවියේ ප්‍රතිසංස්කරනවාදීන් යුග ගනනාවක් තිස්සේ පිටෙහි නැගී ගිය පැරනි යුද අශ්වයා වන නීතියේ මූලධර්මය කරා නොමඳ සතුටකින් අප ආපසු ගමන් ගනිමු. පෘතුවියේ ශ්‍රේෂ්ඨ ප්‍රතිසංස්කරන හඹාගෙන දොන් ක්වික් ෂෝට්ලා පිටෙහි නැගී ගිය ශෝචනීය රොසිනන්ටේ කරා අප යලි සැපත් වන්නෙමු. එහෙත් ඔවුන් ආපසු ගෙදර පැමිනියේ තැලී දුර්වර්නවූ දැසින් යුතුව ය."

**මතු සම්බන්ධයි**

© www.wsws.org